# <u>ප්‍රකාශන හිමිකම</u>

ශාස්ත්‍රීය හෝ කලාත්මක කෘතියක නිර්මාණකරුවෙකුට තම කෘතිය සම්බන්ධයෙන් ඇති හිමිකම "ප්‍රකාශන හිමිකම" යන්නෙන් අදහස්වේ. නිර්මාණකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තුලින් ඔවුන් නිර්මාණකරණය සඳහා තව තවත් පෙළඹවීම සිදුවේ. රටක සංවර්ධනයේදී නව නිර්මාණකරණය ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වන්නේය.

## අයිතිවාසිකම්

මෙම හිමිකම ආර්ථික අයිතිවාසිකම් හා සදාචාරාත්මක අයිතිවාසිකම් වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.

ආර්ථික අයිතිවාසිකම් මගින් ප්‍රකාශන හිමිකම දරන්නාට එම කෘතියෙන් ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ අවස්ථාව සලසා ඇත. ඒ අනුව හිමිකම දරන්නාට අදල කෘතිය ප්‍රතිනිෂ්පාදනය, විකිණීම, කුලියට දීම, බෙදහැරීම,පරිවර්තනය කිරීම හෝ එහි වෙනත් විපර්යාසයන් සිදුකිරීම හා මහජනයා වෙත සංනිවේදනය කිරීම ආදී අයිතිවාසිකම් රැසක් හිමිවේ. වෙනත් අයෙකුට එම ක්‍රියාවන් කල හැක්කේ හිමිකම් දරන්නාගේ අවසරය ඇතිව පමණකි. සදාචාර අයිතිවාසිකම් මගින් නිර්මාණකරුගේ ගරුත්වය සහ කීර්තිනාමය ආරක්ෂා කෙරේ. ඒ අනුව කෘතියේ කතෘත්වය පිළිබඳ අයිතිවාසිකම හා කෘතිය විකෘති කිරීමට එරෙහිවීමේ අයිතිවාසිකම එහි නිර්මාණකරු සතුවේ.

## ආරක්ෂාව

මේ යටතේ ආරක්ෂා කරනු ලබන්නේ මුල් ශාස්ත්‍රීය හා කලාත්මක කෘතීන්ය. ශාස්ත්‍රීය හා කලාත්මක කෘතීන් යන්නට පොත්, ලිපි, පරිගණක මෘදුකාංග, වේදිකා නාට්‍ය, චිත්‍ර, මූර්ති,සංගීතය,චිත්‍රපටි හා ඡායාරූප වැනි නිර්මාණ රැසක් ඇතුළත්වේ. "මුල් කෘතිය" යන්නෙන් අදහස් වනුයේ එම නිර්මාණය කතෘගේ ස්වයං නිර්මාණයක් විය යුතුය යන්නය.

කෘතිය නිර්මාණය කිරීම නිසාම නීතියේ ක්‍රියාකාරීත්වයෙන් ප්‍රකාශන හිමිකම ආරක්ෂාවේ. ලියාපදිංචි කිරීම වැනි කාර්ය පරිපාටික අවශ්‍යතාවන් නොමැත. නිර්මාණකරුගේ ජීවිත කාලය තුල සහ ඔහුගේ මරණින් පසු වසර 70 ක් මෙම හිමිකම පවතී.

ආරක්ෂිත අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට එරෙහිව සිවිල් හා අපරාධ අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමටත් ඒ මගින් තම අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීමටත් හිමිකරුට පිළිවන. නැතහොත් අදල ගැටළුව සාකච්ඡා මගින් නිරාකරණය කර ගැනීමට බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහාය පැතිය හැකිය.

නිර්මාණකරුවෙකුගේ අයිතිවාසිකම් ශ්‍රී ලංකාවේ මෙන්ම ශාස්ත්‍රීය හෝ කලාත්මක කෘතීන් ආරක්ෂා කිරීම පිළිබඳ බර්න් සම්මුතියේ සියලුම සාමාජික රටවල ද ආරක්ෂා කෙරේ.

## පරිපාලනය

තම අයිතිවාසිකම් පරිපාලනය කිරීම, එනම් භාවිතාව සඳහා අවසර දීම ඒ වෙනුවෙන් කතෘ භාග අයකිරීම, අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සොයා බැලීම හා ඊට එරෙහිව ක්‍රියාකිරීම ආදිය හිමිකරුවෙකුට පුද්ගලිකව කළ හැකිය. නොඑසේ නම් සාමූහික පරිපාලන සංගමයක් මගින් කළ හැකිය.

## සම්බන්ධිත අයිතීන්

ප්‍රකාශන අයිතියට අමතරව සම්බන්ධිත අයිතීන් නම් අයිතිවාසිකම් සමූහයක් ද පිළිගෙන තිබේ. ඊට ඇතුලත් වන්නේ ගායකයන් හෝ රංගන ශිල්පීන් වැනි ශිල්පීන්ගේ ද, ශාබ්දික තැටි හා පටි නිශ්පාදකයන්ගේ ද,ගුවන් විදුලිය හා රූපවාහිනිය වැනි  විකාශන ආයතන වල ද අයිතිවාසිකම්ය.

ඔබට අවශ්‍ය වැඩි විස්තර සඳහා අමතන්න.

**Tel:** 011- 2689368, 011- 2688768. **Fax**: 0112689367. **Email:** nipos@slt.lk,

**Web Site**: www.nipo.gov.lk

**ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**

සැකසුම:
එස්.පී.එම්.කේ.ගුණසේකර, පර්යේෂණ සහකාර,
ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය.

Designed by Manoj Lakmal Botheju